- **ආදරණීය දුවේ පුතේ,**
- **මෙම ඡේදය හොඳින් කියවන්න.**

වත්ත පහළ ඇති කැලෑ රොද අපගේ සිත්ගත් තැනක් විය. පාසල් ගොස් නිවසට පැමිණි විට අපි යහළුවන් සමඟ කැලයට ගියෙමු. යහළුවෝ සැම විට ම එහි යෑමට අපේක්ෂාවෙන් පසු වූහ. අප කැලෑ සතුන් නොදුටුව ද කැලයේ සත්තු නැතැයි අප කිසි විටෙක සිතුවේ නැත. දිනක් මුව දෙන්නු සිය පැටවුන් සමඟ අසල ඇති දොළ පාරක් වෙත පැමිණියහ. පැටවු මුව දෙනුන් සමඟ සුරතල් වෙති. එය අප කාගේත් සිත් පැහැර ගත් දසුනකි. දොළ පහර පහළට වැටෙන තැන සැදී ඇති කුඩා වළෙහි මාළුවෝ ඇත. ඒ දුටු අපට සිහිපත් වූයේ සතුන් වත්තේ මින් මැඳුරෙහි සිටින මාළුවෝ ය. ගස් උඩ සිට අප දෙස බලා සිටින වඳුරන් දුටු විට අප සිනාසුණේ උන්ගේ විහිළු ක්‍රියා නිසා යි. වඳුරෝ ගසින් ගසට පැන අතු කඩා දමන්නට වූහ. කුරුල්ලෝ ද පලතුරු ගස්වල නිරන්තරයෙන් ගැවසෙති. කුරුල්ලන් නඟන මිහිරි නාදය අප සිත් සතුටු කරවීමට සමත් වෙයි. ඉදුණු මී අඹ පිරී ඇති ගස්වල ගිරවු පදිංචි වී සිටිති. ගිරවුන් අඹ කද්දී අඹ ඇට පහළට වැටෙයි. අපේ වත්ත පහළ ඇති කැලෑ රොද ඒ තරම් ම ප්‍රියජනක ය.

උදාහරණය:-

බහු වචන උක්ත පද	බහු වචන අනුක්ත පද
සෙනෙවිවරු	**සෙනෙවිවරුන්**
කතුවරියෝ	**කතුවරියන්**
සෙබලු	**සෙබලුන්**

ඡේදය ඇසුරෙන් පහත වගුව පුරවන්න.

බහු වචන උක්ත පද	බහු වචන අනුක්ත පද